# ලක්දිව පුස්කොළ ලේඛන කලාවෙහි ආරම්භය හා විකාශය

- වැලිවිට සොරත හිමි

මනුෂ්‍ය වර්ගයාගේ ආරම්භයේ පටන් ම භාෂණ ව්‍යවහාරය බිහි වුවත් ලේඛන කලාව ආරම්භ වූයේ ඊට බොහෝ කලකට පසුව බව වාග් විද්‍යාඥයින් හා භාෂා විශාරදයින්ගේ පිළිගැනීමයි. මේ මතය තහවුරු කිරීම සඳහා ප්‍රාග් ඓතිහාසිකව හමුවන සාධක වන්නේ ලෙන් සිතුවම් ඇතුළු පුරාවිද්‍යාත්මක ලේඛනයන්ය. ඒ අනුව ලේඛන කලාව යනු ඓතිහාසික ලේඛනවලට මුල පිරුවා වූ ශිෂ්ටාචාරයක ආරම්භය වේ. විශේෂයෙන් ම සමාජය නාගරීකරණය වීමත් සමග ලේඛන කලාව ආරම්භ වන්නට ඇතැයි සිතිය හැකිය. වෙළහෙළඳාම් කිරීමේ දී ගණන් මිනුම් සටහන් තබා ගැනීම පිණිස මෙම ක්‍රමය යොදාගෙන ඇති බවට සාධක එළවිය හැකිය. පුරාවිද්‍යාත්මකව සැලකිල්ලට ගැනීමේ දී ඒ සඳහා භාවිත කර ඇත්තේ බ්‍රහ්මයා විසින් නිර්මාණය කරන ලදැයි කියවෙන බ්‍රාහ්මී අක්ෂරයි. ඒ අනුව බ්‍රාහ්මී අක්ෂර හෝඩිය ලේඛන කලාවේ දී යොදාගත් පැරණිතම අක්ෂර ලෙස පිළිගැනීමට සිදුවේ. බ්‍රාහ්මී අක්ෂර හෝඩියේ ප්‍රභවය සම්බන්ධයෙන් ජෛනාගමිකයන්ගේ සමවායාංග සූත්‍රයේ හා පඤ්ඤවහා සූත්‍රයේ එකිනෙකට වෙනස් අක්ෂර හෝඩි 18 ක් ගැන ද, සර්වාස්තිවාදීන්ගේ ක්‍රි. ව. පළමුවන සියවසේ රචිත ලලිතවිස්තරයේ බුද්ධකාලීනව පැවති අක්ෂර හෝඩි හයක් (6) ගැන ද මහාවස්තුව නම් මහායාන කෘතියේ අක්ෂර හෝඩි 30 ගැන ද සඳහන් වේ.[1] බෞද්ධ මූල ග්‍රන්ථවල ලේඛනය සම්බන්ධයෙන් කරුණු හමුවන්නේ විනය පිටකයේය.[2] එහි ඒ පිළිබඳ වචන තුනක් හමුවෙයි. එනම් ලේඛා, මුද්දා, ගණනා යනුවෙනි. මේවා උසස් ශිල්ප කලාවන් (උක්කට්ඨං සිප්පං) ලෙස දක්වා තිබේ. මේ අනුව 'ලේඛා' යන්නෙන් ලිවීමත් 'මුද්දා' යන්නෙන් ලේඛනය හා සම්බන්ධ මුද්‍රා තැබීමත් 'ගණනා' යන්නෙන් නාගරික ආර්ථිකය හා සම්බන්ධ වෙළ හෙළඳාම් කිරීම, මැනීම ආදිය සඳහා යොදා ගත් වචන ලෙස දැක්විය හැකිය.

ලක්දිව ලේඛන කලාවෙහි ආරම්භය සම්බන්ධයෙන් තොරතුරු හමුවන්නේ දීපවංස, මහාවංස යන ඓතිහාසික කෘති තුළිනි.

ක්‍රි. පූ. 6 වන සියවසේ විජය කුමරුගේ ලංකාගමනය සිදු වූ මුල් කාලවකවානුවේ දී ම ලේඛන කලාව ඇරඹී බව එහි සඳහන් වේ. ඔහු සිය අභිෂේකය සඳහා පඬි රජුගේ දියණිය කැඳවාගෙන එන ලෙස දන්වා පඬි රජුට පඬුරු සමග ලේඛනයක් ද දී මධුරා පුරයට දූතයන් යැවීය.[3] පඬි රජු ද සිය දියණිය භද්දකච්චායනා සමග ලේඛනයක් ද විජය කුමරු වෙත එවා ඇත.[4] එසේම විජය රජු සිය ජීවිතයේ අවසන් භාගයේ දී ඔහුගෙන් පසු ලක්දිව රාජ්‍යය භාරගන්නා ලෙස දන්වා සිය සොයුරු සුමිත්ත කුමරුට යැවීම සඳහා ලිපියක් ඇමතියන්ට දී මියගොස් ඇත.[5] ක්‍රි. පූ. 4 වන සියවසේ පණ්ඩුකාභය කුමරා පණ්ඩුල නම් බ්‍රාහ්මණයාගෙන් ශිල්පය උගත් බව සඳහන් වන අතර මේ සඳහා ද ලේඛන කලාව අනිවාර්යයෙන් යොදාගන්නට ඇතැයි කිව හැකිය. අභය රජු පණ්ඩුකාභය කුමරුට රහස් ලිපියක් යැව් අතර ඔහු එය කියවා තේරුම් ගැනීමෙන් ඒ බව පැහැදිලි වේ.[6]

අනුරාධපුර යුගයේ මුල් කාලයේ සිට ම ලක්දිව විහාරස්ථාන කේන්ද්‍ර කරගෙන පිරිවෙන් ආරම්භ වූ බවට සාධක හමුවේ. මිහිඳු මාහිමියාණන් වහන්සේ ලක්දිවට වැඩම කොට ආරම්භ කරන ලද කාල පාසාද පිරිවෙණ එහි මූලාරම්භයයි. භාරතයේ පැවති පළමුවන ධර්ම සංගායනාවේ දී ධර්මය ඉදිරියට පවත්වාගෙන යාමට භාණක පරම්පරාවක් ඇති කළ අතර ඔවුහු සියලු ධර්මය කටපාඩමින් රැගෙන ආ බව කවුරුත් දන්නා කරුණකි. පිරිවෙන් ආයතනයක් ලක්දිව ආරම්භ කළ තැනේ දී ද එම වණපොත්කරණය පැවතුණි. එහෙත් එම ආයතනයෙන් වණපොත්කරණය පමණක් නොව ලේඛන කලාව ද උගන්වන්නට ඇතැයි සිතිය හැකිය. මහාවිහාරය කේන්ද්‍ර කරගෙන පැවති පිරිවෙන් පසුකාලීන වන විට අභයගිරිය, තිස්සමහාරාමය, මණ්ඩලාරාමය, ආළාහන පිරිවෙන හා දිඹුලාගල වැනි පිරිවෙන් දේශීය වශයෙන් මෙන්ම විදේශීය වශයෙන් ද ප්‍රචලිතව පැවතුණි.

මිහිඳු මාහිමියාණන් විසින් ලක්දිවට රැගෙන ආවේ පෙළ දහම පමණක් නොවන බව මහාවංසයේ කියවේ. පෙළ සාහිත්‍යය සමග අටුවා ද රැගෙන ආ බවත් ඒවා දීපවාසීන්ගේ තේරුම් ගැනීමේ පහසුව උදෙසා සිංහලයට පරිවර්තනය කළ බවත් කියවේ. මෙය වාචනා මාර්ගයෙන් ම පැවතුණා ද නැතහොත් ලේඛන ගත කළේද

යන්න සඳහන් නොවේ. පුරුෂ පාර්ශ්වයට පමණක් නොව ස්ත්‍රී පාර්ශ්වය විසින් ද අධ්‍යාපනය කෙරෙහි වැඩි නැඹුරුවක් දක්වා ඇති අයුරු ද දැකගත හැකිය. මහානාග උපරජුගේ බිසව වූ අනුලාවන් ඇතුළු පන්සියයක් කාන්තාවන්ට මෙන්ම දෙවනපෑතිස් රජුගේ මාළිගාවේ සෙසු ස්ත්‍රීන්ට ද භාෂාව හා ගැඹුරු කරුණු කෙරෙහි මනා දැනුමක් තිබුණේ යැයි කිව හැකිය. කල්‍යාණතිස්ස රජුගේ බිසවට අක්ෂර කලාව පිළිබඳ දැනුමක් තිබුණු බව උත්තිය කුමරු හා ලිපි හුවමාරු කරගැනීමේ සිද්ධියෙන් පැහැදිලි වෙයි. බ්‍රාහ්මී ලෙන් ලිපිවල සඳහන් වන පරිදි රජ බිසවගේ පටන් දිළිඳු කාන්තාවන් පවා භික්ෂූන් වහන්සේලාට ලෙන් සකස් කොට පූජා කළ බවත් ඒවා අක්ෂර මගින් ලෙන්වල කොටා ඇති බවත් දැකිය හැකිය. ඇතැම් කාන්තාවන් ඕනෑම ධර්ම කරුණක් සම්බන්ධයෙන් එහි ඇති සත්‍යාසත්‍යතාව තේරුම් ගැනීමට තරම් ගැඹුරු ඥානයක් තිබුණි. මහසෙන් රජුගේ බිසව වෛතුල්‍යවාද පොත් පත් සියල්ල විනාශ කරවූයේ ථෙරවාද හා මහායානයේ ඉගැන්වෙන ධර්ම කාරණා පිළිබඳ මනා පරිචයක් ලබා තිබූ බැවින් යැයි තහවුරු කළ හැකිය.[7] එසේම භික්ෂූන් වහන්සේලා පුරුෂ පක්ෂයට අධ්‍යාපනය ලබා දුන්නාක් මෙන් භික්ෂුණීන් විසින් ස්ත්‍රීන්ට අධ්‍යාපනය ලබා දෙන ලදි. මෙම තොරතුරු පදනම් කරගෙන අතීතයේ පටන් ම අධ්‍යාපන ක්‍රමවේදයක් ගිහි පැවිදි මෙන් ම ස්ත්‍රී පුරුෂ පාර්ශ්වයන්ට තිබුණු බවට කරුණු දැක්විය හැකිය.

ඒ අනුව සියල්ලන්ට අධ්‍යාපනය ලබා දීමේ දී භාෂාව හුරු පුරුදු කිරීමේ දී ලේඛන කලාව ද බෙහෙවින් ඉවහල් වී තිබෙන අයුරු පැහැදිලි වෙයි. ඒ සඳහා භාවිත කළ අමුද්‍රව්‍ය කුමක්දැයි යන්න පිළිබඳ හරිහැටි විස්තරයක් දක්නට නොලැබුණත් ඔවුන් භාවිත කර ඇත්තේ පුස්කොළ යනුවෙන් හඳුන්වන තල්කොළ බව ආරිය ලගමුව මහතාගේ අදහසයි.[8] මීට අමතරව හසුන්පතක් හෝ පණිවිඩයක් යැවීම සඳහා භාවිත කළ අමුද්‍රව්‍ය පිළිබඳ ව තොරතුරු හමුවේ. පරණවිතාන මහතාගේ අදහසට අනුව ලක්දිව මුල් යුගයේ ග්‍රන්ථ හෝ පණිවිඩ යැවීමේ දී ලේඛනය සඳහා උණ පතුරු භාවිතා කර ඇත. ඒ සඳහා ඔහු දක්වන සාක්ෂිය වන්නේ ''පොත්ථක වංසඵලකෙ වණ්ණානි කම්මානි විය''[9] යන වංසත්ථප්පකාසිනියේ සඳහන් වන වගන්තියකි. එයින් අදහස් වන්නේ දැව ඵලක හෙවත් පතුරුවලින් කළ වර්ණවත්

දෑ යනුවෙන් සඳහන් වී තිබීම නිසාය යන අර්ථය දැක්වීමෙනි. එහෙත් මෙහි ඵලක යනුවෙන් හඳුන්වන්නේ පුස්කොළවල ලියා එහි ආරක්ෂාවට පිටකවරයක් සැකසීමේ දී යොදාගත් දැව ඵලකය හෙවත් කම්බාවක් යැයි කියති. එම කම්බාව මනරම් ලියවැල් ආදියෙන් සකසා ඇති බැවින් ''වර්ණවත් සිතුවම් වැඩ වැනි'' අදහස ගෙන දෙයි.

උණ හෝ දැව පතුරු යොදාගත් තවත් අවස්ථාවක් උම්මග්ග ජාතකයේ කථා පුවතේ විස්තර වේ. මහෞෂධ පඬිවරයා මාංශ ප්‍රශ්නය විසඳූ අයුරු දන්වමින් රජුට තුඩපතක් යැවූ බව කියවේ.[10] මේ තුඩපත ලිවීම සඳහා යොදාගෙන ඇත්තේ උණපතුරක් යැයි සඳහන් කරයි. භාරතයේ තල්කොළ බහුල නොවීම හා මෙම ප්‍රශ්නය විසඳූ අවස්ථාවේ දී ම එවැන්නක් සොයාගන්නට කාලවේලාවක් නොතිබූ නිසා උණ පතුරක් මගින් එම පණිවිඩය යැවීමට කටයුතු කළේ යැයි සිතිය හැකිය. පැරණි භාරතයේ පෞද්ගලික හා රාජ්‍ය මට්ටමේ ලේඛන කටයුතුවල දී අමුද්‍රව්‍යයක් ලෙස කපු රෙදි හා පට රෙදි යොදා ගැනීම ද විශේෂයෙන් දැකිය හැකිය. එහෙත් ලංකාවේ එවැනි ද්‍රව්‍ය යොදා ගත්තේ අල්ප වශයෙනි. දීඝවාපි ස්තූපයේ අක්ෂර ලියන ලද පතාකයක් තිබී හමු වූ පුවතක් හා චෛතියගිරියේ එයට රෙදි පූජා කළ පුද්ගලයාගේ නම පතාකයක ලියා තිබෙනු වන්දනාකරුවෙකු දුටු බව සීහළවත්ථුප්පකරණයේ සඳහන් වේ.[11]

මීට අමතරව ඉතා වැදගත් හා කෙටි වගන්ති දැක්වීම සඳහා ලේඛන ලෙස භාවිත කර ඇත්තේ ශෛල හෙවත් පර්වත හෝ ගල්කණුය. අශෝක ශිලා ලේඛනවල ලියා ඇති ඒවා ක්‍රි. පූ. 3 වන සියවසට අයත් ඒවාය. ලක්දිව දී ද බොහෝ සෙයින් ආරාම ලෙන් ආශ්‍රිතව මෙවැනි කෙටි යෙදුම් සහිත ප්‍රකාශන බොහෝ සෙයින් දැකගත හැකිය. මෙම ක්‍රමය දේවානම්පියතිස්ස රජුගේ කාලවකවානුවේ සිට එනම් ක්‍රි. පූ. 3 වන සියවසේ සිට 16 වෙනි සියවස දක්වා ව්‍යාප්ත වෙමින් පැවතුණි. ඉන්පසුව ද අතරින් පතර මෙම ක්‍රමය උපයෝගි කරගෙන ඇති බවට සාධක හමුවේ.

එසේම ක්‍රි. පූ. 6 වන සියවසේ සිට ලේඛනය සඳහා ලෝහමය තහඩු ලිපි ද්‍රව්‍යයක් වශයෙන් යොදාගෙන ඇති බවට බෞද්ධ සාහිත්‍යයේ බරණැස් රජුට බුද්ධ, ධම්ම හා සංඝ යන තෙරුවන් ලොව පහළ වූ බව කියවෙන පුවතක් දැගිලිවලින් රන් පතක ලියා සත්රුවන්

කරඬුවක බහා කාෂ්ඨවාහන රජුට යැවීමේ ප්‍රවෘත්තියක් සුත්තනිපාත අටඨකථාවේ සඳහන් වෙයි.[12] දුටුගැමුණු රජු මහාථූපය නිර්මාණය කරන බව සඳහන් කරමින් දේවානම්පියතිස්ස රජු රන්පතක ලියා රජමාළිගයේ කරඬුවක තැන්පත් කළ පුවත මහාවංසයේ සඳහන් වේ.[13] කැලණිතිස්ස රජුගේ කාලයේ දී මුහුද ගොඩගැලූ අවස්ථාවේ තම දියණිය වන 'දේවි' කුමරිය රන්සැලියක නංවා එහි 'රාජ දියණිය' යනුවෙන් ලියවා මුහුදේ පා කර යවා ඇත.[14]

ඉන්දියාවේත් ලංකාවේත් පූර්ව ඓතිහාසික යුගයේ සිට මැටිබඳුන්වල ද අක්ෂර ලේඛනය සිදු කර ඇති බව පුරාවිද්‍යාත්මක සාධක මගින් තහවුරු කරගෙන තිබේ. බොහෝ දුරට මෙහි ඇතුළත් කර ඇත්තේ එම භාණ්ඩ නිෂ්පාදකයින්ගේ නම් හෝ ආයතන නාමයන්ය. මේ අනුව පැරණි යුගයේ භාවිත සෙල්, ලෝහ, පතුරු, දැව, රෙදි හා මැටි ආදි සියලු අමුද්‍රව්‍ය භාවිත කර ඇත්තේ සුළු වචන ප්‍රමාණයක් ඇතුළත් කරමින් තොරතුරු දැක්වීම පිණිස මිස පුළුල් සාහිත්‍යයක් ගොඩ නැගීමේ අරමුණින් නොවේ.

කෙසේ නමුත් පුස්කොළවල ලේඛනය සිදු කළ බවට තොරතුරු ක්‍රි. පූ. 6 වන සියවසේ සිට පැවති බවට සාධක හමුවේ. මහාවග්ගපාළියේ සඳහන් වන පරිදි උපාලි නම් කුමරෙකුට අක්ෂර ඉගැන්වීම පිළිබඳ කරුණු හෙළි වෙයි.[15] ඔහුගේ දෙගුරුන් සිතුවේ උපාලිට අකුරු කරන්නේ නම් ඔහුගේ ඇඟිලි රිදෙන බවයි. පුස්කොළවල පන්හිදෙන් අක්ෂර ලිවීමෙදී අත් දෙකෙහි ම ඇඟිලි තුඩු භාවිත කළ යුතුය. එයින් ඇඟිලිවලට වේදනාවක් හෝ පීඩාවක් ඇති වේ. එසේම පුස්කොළවල ලිවීමේ දී ඒ පිළිබඳ ප්‍රාගුණ්‍යයක් නොමැති කෙනෙකුට එකවර කිරීමට නොහැකිය. විශේෂයෙන් කුඩා දරුවෙකුට එය කෙසේවත් කළ නොහැකිය. එබැවින් මහාවග්ගපාළියේ සඳහන් වන පාඨය අනුව අක්ෂරකරණයේ දී පුස්කොළ භාවිත කළ බව පැහැදිලිය.

තල්කොළ භාරතයේ සුලභ ශාඛයක් නොවුණත් පැරණි යුගයේ සිට ම ඒවා භාවිතයට ගෙන ඇති බව බියුලර් හා රීස් ඩේවිඩ්ස් වැනි පඬිවරු පිළිගනිති.[16] ඩේවිඩ්ස් මහතා පවසන පරිදි උතුරු හා මධ්‍යම ඉන්දියාවේ තල්කොළ සපයාගෙන ඇත්තේ මුහුදුබඩ ප්‍රදේශවල

සිට ඔරිස්සාවට අයත් ගංගා නම් ගඟ ඔස්සේ ප්‍රවාහනය කිරීමෙනි. බෞද්ධ අනුග්‍රහය යටතේ ලේඛන කලාව පුළුල් ලෙස ව්‍යාප්ත වීමට හේතු වූ බව කුලසූරිය මහතා ද පිළිගනියි. කරුණු මෙසේ හෙයින් තල්කොළ බහුල ලක්දිව ආරම්භක යුගයේ සිට ම පුස්කොළ භාවිත වූවා යැයි හඳුනාගත හැකිය.

''උපසපන් භික්ෂූන්ට තල්කොළවල ලියා මරණයේ ගුණ වර්ණනා නොකළ යුතු බවත් එසේ කරන්නේ නම් ඔහුට දුකුලා ඇවැත සිදුවන බවත් කංඛාවිතරණී මාතිකට්ඨකථාවේ සඳහන් වේ.[17] සමන්තපාසාදිකාවේ පාචිත්තිය වර්ණනාවේ සඳහන් වන අන්දමට මාදු ඉන්දසාල හා නුහි[18] වැනි ගස්වල කඳන්වල හෝ එවැනි වර්ගවලට අයත් වෙනත් ගස්වල හටගත් තල්කොළ ආදි කොළවල ගස් පතුරුවල හෝ අකුරු ලියන්නා වූ භික්ෂුව පාචිත්තිය ඇවැතට පත්වෙයි.[19] ඉහතින් සඳහන් කළ ඉන්දසාල හෙවත් හල් නමින් හැඳින්වෙන ගස් විශේෂය ලක්දිවට පමණක් ආවේණික වූවකි. මේ හේතුව නිසා ලක්දිව පුස්කොළ ලේඛනයේ දී භාවිත කළ ප්‍රධාන ලේඛන මාධ්‍යය වූ බව පැහැදිලි වෙයි.[20]

අතීතයේ පටන් ම ලේඛන කලාවේ දී යොදාගත් කොළ වර්ග කිහිපයක් පිළිබඳව ද තොරතුරු හමුවන අතර ඒ අතරින් වට්ටගාමිණී අභය රජු කුපික්කල මහාතිස්ස හිමියන්ට වැටකේ පතක ලියා අභයගිරි විහාරය පවරා දෙන ලද බව මහාවංසයේ සඳහන් වේ.[21] මේ කාලය වන විටත් තල්කොළ භාවිතය තිබුණ අතර ඒවා සොයා ගැනීමේ දී දුෂ්කරතා ඇති වූ විට හෝ හදිසි අවස්ථාවල දී වෙනත් ගස්වල පොතු හෝ කොළ යොදාගත් බව මෙයින් පැහැදිලි වෙයි.

බුද්ධඝෝෂ හිමියන් ක්‍රි. ව. 5 වන සියවසේ දී අට්ඨකථා රචනා කරන ලද්දේ ක්‍රි. පූ. 3 වන සියවසේ මිහිඳු මාහිමියාණන් විසින් සිංහලට නගන ලද හෙළටුවා ආශ්‍රයෙනි. පාලි අට්ඨකථාවන්හි අඩංගු වන්නේ ද හෙළටුවාවන්හි ඇතුළත් කරුණුය. ඒ සඳහා මහාට්ඨකථාව, පච්චරී අට්ඨකථා හා කුරුන්දි අට්ඨකථා බෙහෙවින් ඉවහල් වී තිබේ. ඊට අමතරව සංඛෙප අට්ඨකථා හා අන්ධට්ඨකථා යනුවෙන් ද අදිකාරම් මහතා පෙන්වා දෙන අන්දමට මූලාශ්‍රය 28 ක් ද උපයෝගි වී තිබේ.[22]

මේ සඳහා අමුද්‍රව්‍ය ලෙස තල්කොළ යොදාගත් බව තහවුරු වෙයි. ලක්දිව පැරණිම වංශකථාව වන දීපවංසය රචනා කිරීමේ දී ද නානා වර්ණයන්ගෙන් යුත් කුසුමයක් මෙන් ග්‍රන්ථ කරන ලද පරම්පරාගත වංසකථාවන්ගෙන් යුත් අට්ඨකථා නම් පුරාණ ලේඛනයක් තමාට උපස්ථම්භක වූ බව එහි කතුවරයා සඳහන් කරයි.[23] ඒ අනුව අට්ඨකථා හා වංසකථා වැනි දීර්ඝ පොත් රචනා කිරීමේ දී තල්පත් බෙහෙවින් ඉවහල් වූ බව පැහැදිලිය. එසේම මහාකාව්‍ය රචනා කිරීමේ දී ද තල්පත් භාවිත වී තිබේ.

පැරණි කාලයේ පොත්පත් රචනා කිරීම සඳහා වෙනම ලේඛකයන් සිටි බවත් ධනවතුන් විසින් එවැනි ලේඛකයින් අතීතයේ පැවති පිංපොත ලිවීම සඳහා යොදාගත් බවත් කියවේ. දුටුගැමුණු රජතුමා මරණ මංචකයේ දී කියවාගෙන ඇත්තේ එවැනි ලිපිකරුවෙකු විසින් ලියන ලද්දක් යැයි මහාවංසයේ සඳහන් වේ.[24] මෙම විස්තරයේ දී මෙන් ම මහාවංසයේ බොහෝ තැන්වල 'පොත්ථකං' යන වචනය යෙදී ඇති බැවින් එම පොත් සකස් වී තිබුණේ පුස්කොළවලින් බව පැහැදිලි වෙයි.

පුස්කොළවල ලිවීමේ ලේඛන කලාව බොහෝ සෙයින් සිදු කර ඇත්තේ විහාරස්ථාන කේන්ද්‍ර කරගෙනය. අතීතයේ පටන් ම ආරාම ආශ්‍රය කරගෙන තල්ගස් රෝපණය කර ඇත්තේ පුස්කොළ සකසා ගැනීම සඳහා මය. නැතිනම් තල්ගස්වලින් ආරාමවලට වෙනත් ප්‍රයෝජනයක් නොමැත. මුල් යුගයේ පටන් ම තල්ගස් ආරක්ෂා කර ගැනීම සඳහා විවිධ උපක්‍රම ද යොදවා තිබේ. බුද්ධඝෝෂ හිමියන් පවසන පරිදි එවැනි ආරක්ෂක විධි අතර තල් ගසට නැගීමට අපහසු වන පරිදි කම්බි පටලවා ඇත.[25] තල්පත් භාවිතය අත්‍යවශ්‍ය කාරණයක් සේ සැලකූ නිසා මෙසේ සිදු කරන්නට ඇති බව විශ්වාස කළ හැකිය. 10 වන සියවස වන විට තල්ගස් කැපීම පවා තහනම් කොට ඇත. පස්වන මිහිඳු රජුගේ කාලයේ මිහින්තලේ පුවරු ලිපියෙහි ඒ බව සඳහන් වේ.[26]

ක්‍රි. පූ. හා ක්‍රි. ව. පළමුවන සියවසේ දී වට්ටගාමිණී අභය රජුගේ කාලයේ ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කළ බව පැහැදිලි කරුණකි. මේ

වන තෙක් වණපොත් ක්‍රමයට හෙවත් කටපාඩමින් පවත්වාගෙන ආ සියලු බුද්ධවචනය සහිත ත්‍රිපිටකය බැමිණිතියා සාය ඇති වීම හේතුවෙන් මතු පරම්පරාවට ගෙනයාම හා නැවතත් එවැනි සාගතයක් පැමිණියහොත් ත්‍රිපිටකය නැති වේය යන සංකල්පනාව මතු කළ භික්ෂූන් වහන්සේලා රජුගේ ද අනුග්‍රහය ඇතිව මාතලේ අළු ලෙන දී ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කළහ. මෙහිදී භාවිත කර ඇත්තේ ද තල්කොළ බව පැහැදිලිය. මුලින් කී පරිදි විශාල ප්‍රමාණයේ සාහිත්‍යයක් වෙනත් අමුද්‍රව්‍ය යොදා ගනිමින් සකස් කිරීම අපහසුය. එබැවින් තල්කොළ භාවිතය ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීමේ දී භාවිත කළ බව පැහැදිලි වේ.

තල්පත්වල ලියා ග්‍රන්ථ වැඩි ප්‍රමාණයක් රචනා කර ඇත්තේ බුද්ධඝෝෂ හිමියන් බව සඳහන් කළ හැකිය. තල්කොළයේ ලිවීමට ආධාරකය වන්නේ පන්හිඳයි. බුද්ධඝෝෂ හිමියන් දකුණු ඉන්දියාවේ සිට නැව් නැගී ලක්දිවට පැමිණෙන අවස්ථාවේ මුහුද මැද දී බුද්ධදත්ත හිමියන් හමු වූ බවත්, කරුණු විමසා බැලීමෙන් පසු අට්ඨකථාකරණය සඳහා ලක්දිවට යන බව දැනගැනීමත්, තමන් ද එම කාර්යයේ නිරත වීමට උත්සාහ කළ බවත් එහෙත් එය ව්‍යර්ථ වී ගිය බවත් උන්වහන්සේ තමා සන්තකයේ තිබූ පන්හිඳ බුද්ධඝෝෂ හිමියන්ට දී කිරීමට යන කාර්යය සාර්ථක වේවායි ආශිර්වාද කළ බවත් බුද්ධඝෝසුප්පත්තියේ සඳහන් වේ.[27] ඒ අනුව මේ හිමිවරුන් දෙදෙනා ම පන්හිඳ භාවිතයෙන් තල්කොළවල ලිවීමේ දක්ෂතාව දැක් වූ බව පැහැදිලිව පෙනේ.

බුද්ධඝෝෂ හිමියන් විසින් අට්ඨකථා රචනා කිරීමෙන් අනතුරුව පැවති සිංහල අටුවා සියල්ල එකතු කොට තැබීමෙන් පසු එය මහාථූපය තරම් විශාල වූ බවත් ඒ සියල්ල ගිනිබත් කළ බවත් බුද්ධඝෝසුප්පත්ති කථා නම් කෘතියේ සඳහන් වේ.[28] වඩා විශ්වසනීයත්වයෙන් තොර වූ මෙම ග්‍රන්ථයෙහි සඳහන් වන ඉහත කාරණය කෙසේවත් විශ්වාස කළ නොහැකි නමුදු මේ යුගයේ මේ සා විශාල පුස්කොළ පොත් ප්‍රමාණයක් පැවති බවට එය අනියම් සාධකයක් වනු නො අනුමානය.

අට්ඨකථා යුගයෙන් පසු හමුවන ටීකා යුගයේ දී ද ත්‍රිපිටකයේ සියලු ග්‍රන්ථවල ටීකා ග්‍රන්ථ ලියා තිබේ. ටීකා ග්‍රන්ථවල ආරම්භය අනුරාධපුර

යුගයේ වුවත් එහි ව්‍යාප්තිය සිදු වූයේ පොළොන්නරු යුගයේ දී ය. මහාකාශ්‍යප හිමියන්ගේ වැඩි දායකත්වයෙන් ලියා ඇති ටීකා ග්‍රන්ථ ලේඛනය සඳහා ද යොදාගෙන ඇත්තේ තල්කොළය.

ඇතැම් දේශීය හා විදේශීය ආක්‍රමණ පැමිණුන අවස්ථාවල දී පුස්කොළ පොත් විශාල වශයෙන් ගිනිබත් කොට විනාශ කළ බව ඓතිහාසික ලේඛන පරීක්ෂා කිරීමෙන් පැහැදිලි වෙයි. මහසෙන් රජුගේ රාජ්‍ය කාලයේ දී මහාවිහාරය සම්පූර්ණයෙන් විනාශ කොට එහි පැවති පොත පත ද විශාල වශයෙන් විනාශ කර ඇත. ආරම්භක යුගයේ පටන් ම පසුකාලීන වන තෙක් හෙවත් දේවානම්පියතිස්ස, මහානාම, වළගම්බා, මහාවිජයබාහු, මහාපරාක්‍රමබාහු වැනි රජවරුන්ගේ කාලවල දී රචනා වූ පොතපත අභයගිරි හා මහාවිහාර සම්ප්‍රදායයන් පදනම් කරගෙන විශාල වශයෙන් විනාශ කර ඇත. මහසෙන් යුගය ඒ අතර පැවති දේශීය ආක්‍රමණයක් ලෙස පෙන්වා දිය හැකිය. අනුරාධපුර යුගයේ අවසාන භාගයේ ඇති වූ ආර්යචක්‍රවර්තීන්ගේ ආක්‍රමණයත්, පොළොන්නරු අවසන් කාලයේ ඇති වූ කාලිංගමාඝගේ ආක්‍රමණයත් හේතුවෙන් වෙහෙර විහාර මෙන් ම විශාල වශයෙන් පොත් පත් ද විනාශ කර ඇත.

කුරුණෑගල යුගය දී ද පුස්කොළ ලේඛන කලාව ව්‍යාප්ත වූ තවත් යුගයක් ලෙස හඳුන්වා දිය හැකිය. දෙවන කලිකාල සාහිත්‍ය චක්‍රවර්ති රජු විසින් ලියන ලද පන්සිය පණස් ජාතක පොත් වහන්සේ ඒ අතර ප්‍රමුඛ වේ. වර්තමානයේ පිටු 1600 කින් සමන්විත ජාතක පොත් වහන්සේ නමක් ශ්‍රී දළදා මාළිගාවේ පුස්තකාලයේ තැන්පත්ව ඇති අතර එය කිනම් යුගයේ ලියූ එකක් ද යන්න සටහන් නොවේ. එහෙත් ඇතමුන්ගේ මතය වන්නේ මෙය රාජසිංහ රජුගේ කාලයේ කරන ලද විනාශයෙන් පසු මහනුවර යුගයේ දී ම රචනා කරන්නට ඇති බවයි. කෙසේ නමුත් ජාතක කථා සියල්ල පුස්කොළවල ලිවීම සඳහා එපමණ කොළ සංඛ්‍යාවක් ගියේ නම් කුරුණෑගල යුගයේ රචනා වූ ජාතක පොත් වහන්සේ සඳහා ද එපමණ හෝ ඒ ආසන්න කොළ ප්‍රමාණයක් යොදා ගන්නට ඇතැයි සිතිය හැකිය. එක් එක් කෙනාගේ අක්ෂරවල විශාලත්වය අනුව මෙය අඩුවැඩි විය හැකිවීම ඊට හේතුවයි.

කෝට්ටේ යුගයේ දී බහුල වශයෙන් ලියවුණේ සන්දේශ කෘති ය. වීදාගම සනානන්ද, කැරගල පද්මාවතී, තොටගමුවේ විජයබාහු, පැපිලියානේ සුනේත්‍රාදේවි හා මුල්කිරිගල, ඉරුගල්කුලතිලක පිරිවෙන වැනි විද්‍යාස්ථාන කේන්ද්‍ර කරගෙන රචනා වූ බොහෝ කෘති සඳහා ද තල්කොළ භාවිත කෙරී ඇත. ආගම දර්ශනය මෙන් ම වෛද්‍ය ශාස්ත්‍රය, නක්ෂත්‍රය, සංස්කෘත පාලි හා දෙමළ මෙන් ම අර්ථ ශාස්ත්‍රය වැනි ලෞකික විෂයයන් සම්බන්ධ ලේඛන ද මේ කාලයේ දී ම රචනා වී තිබේ. එහි දී ද භාවිතයට ගෙන ඇත්තේ තල්කොළ ම බව කියවේ. මහනුවර යුගයේ දී ද පුස්කොළ භාවිතය බහුල ලෙස යොදාගෙන ඇති බව වර්තමානයේ දක්නට ලැබෙන පුස්කොළ එකතුව දෙස බැලීමෙන් පෙනී යයි. දැනට විද්‍යමානව පවතින බොහෝ පුස්කොළ පොත් මෙම යුගයට අයත් ඒවාය. වැලිවිට සරණංකර සංඝරාජ මාහිමියන්ගේ මූලිකත්වයෙන් උන්වහන්සේගේ උගත් ශිෂ්‍ය පරම්පරාව විසින් බොහෝ ග්‍රන්ථ රචනා කර තිබේ. ඒවායින් වැඩි ප්‍රමාණයක් අද වන විට සුරක්ෂිත වී තිබේ. බොහෝ ග්‍රන්ථ ඉංග්‍රීසි යටත් විජිත සමයේ දී එංගලන්තයට ගෙනගොස් එහි කෞතුකාගාරයේ ද තැන්පත් කොට ඇත.

මේ අනුව ලක්දිව අතීතයේ පටන් ම ඉංග්‍රීසීන් විසින් කඩදාසි ක්‍රමය හඳුන්වා දෙන තෙක් බෙහෙවින් ම තල්කොළ භාවිතයෙන් ලේඛන කලාව සිදුකළ බවට සාක්ෂි හමු වේ. ප්‍රමාණ වශයෙන් ලොකු කුඩා වශයෙන් වෙන් වුවත් විශාල සාහිත්‍යයක් හෝ ග්‍රන්ථයක් රචනා කිරීමේ දී තල්කොළ භාවිතය සිදු වූ බව ඉහත සඳහන් කළ තොරතුරු ආශ්‍රයෙන් වටහා ගත හැකිය.

## ආන්තික සටහන්


1. ලගමුව, ආරිය, ශ්‍රී ලංකාවේ පුස්කොළ පොත් ලේඛන කලාව, සංස්කෘතික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව, බත්තරමුල්ල, 2006, 2 පිටුව.
2. පාචිත්තිය පාළි, බු. ජ. මු. බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල, 2005, 234 පිටුව.
3. පණ්ණාකාරෙ ච ලෙඛං ච.. ඌනපූරණ සහිතො මහාවංසො, පොල්වත්තේ බුද්ධදත්ත හිමි, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ, 1959, 7 පරි. 51 ගාථාව, 12 පිටුව.

4. ලෙඛං දත්වාන පෙසෙසි, -එම-, 57 ගාථාව, 12 පිටුව.
5. ලෙඛං දත්වාන විජයො, -එම-, 8 පරි. 3 ගාථාව, 14 පිටුව.
6. රාජා ලෙඛං කුමාරසි -එම-, 16 පරි. 28 ගාථාව, 56 පිටුව.
7. නිකාය සංග්‍රහය, (සංස්.) කෝන්ගස්තැන්නේ ආනන්ද හිමි, සමයවර්ධන පොත්හල, මරදාන, 2008. 47 පිටුව.
8. ලගමුව, ආරිය, ශ්‍රී ලංකාවේ පුස්කොළ පොත් ලේඛන කලාව, සංස්කෘතික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව, බත්තරමුල්ල, 2006, 73 පිටුව.
9. වංසත්ථප්පකාසිනි, හේ. වි. මු. 270 පිටුව.
10. මහෞෂධ පණ්ඩිතයෝ මේ උපායෙන් උකුස්සා ගසා ගත් මසු වැදැල්ල එළූහ. මේ අරුමය දේවයන් වහන්සේ දන්නා සේක්වා'යි තුඩපතක් යැවීය. උම්මග්ග ජාතකය, (සංස්.) කුමාරතුංග මුනිදාස, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ, 2006, 13 පිටුව.
11. සීහලවත්ථුප්පකරණය, 53 පිටුව.
12. පරමත්තජොතිකා නාම සුත්තනිපාතට්ඨකථා, හේ. වි. මු. 1972, 469 පිටුව.
13. ඌනපූරණ සහිතො මහාවංසො, පොල්වත්තේ බුද්ධදත්ත හිමි, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ, 1959, 27 පරි. 57 ගාථාව, 64 පිටුව.
14 -එම-, 22 පරි. 20-21 ගාථා, 45 පිටුව.
15. උපාලි ලේඛං සික්ඛිස්සති අංගුලියො දුක්ඛා භවිස්සන්ති, මහාවග්ගපාළි, බු. ජ. මු., බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල, 2005, 77 පිටුව.
16. Devids, Ryes, Buddhism India, London, 1950, P. 125.
17. වාචාය වා තාලපණ්ණාදීසු ලිඛිත්වා වා යො එවං මාරෙති සො ධනං වා ලභතීති ආදි නයෙන මරණෙ වා ගුණං පකාසෙය්‍ය ආපත්ති දුක්කටස්සාති, කංඛාවිතරණී මාතිකට්ඨකථා, හේ. වි. මු., 30 පිටුව.
18. ඉන්දසාල යනු දැනට ලක්දිව ප්‍රදේශයේ ඇති 'හල්' නැමති ගස් විශේෂයක් බව ආරිය ලගමුව මහතා පෙන්වා දෙයි. එහි පොත්ත ගණකමින් යුක්තය. නුහි යනු උක්ගස්ය. හල් ගස් ලංකාවට පමණක් ආවේණික වන නිසා මෙම සිදුවීම ලක්දිව සිදුවූවක් බව කිව හැකිය. උක්ගස් ලංකාවේ මෙන් ම ඉන්දියාවේ ද බහුල වශයෙන් දක්නට ලැබේ.
19. හත්ථකුක්කුච්ඡෙන මුදුකෙසු ඉන්දසාල නුහී ඛන්ධාදීසු වා තත්ථ ජාතක තාලපණ්ණාදීසු වා අක්ඛරං ඡින්දන්තස්සා පි එසෙව නායො පාචිත්තියං, සමන්තපාසාදිකා, හේ. වි. මු., 765 පිටුව.
20. ලගමුව, ආරිය, ශ්‍රී ලංකාවේ පුස්කොළ පොත් ලේඛන කලාව, සංස්කෘතික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව, බත්තරමුල්ල, 2006, 63 පිටුව.

21. අථ කෙතකී පණ්ණම්පි ලිඛිත්වා හට්ඨමානසො
 සංඝභොගං විහාරස්ස තස්සපාදා මහීපති
 ඌනපූරණ සහිතො මහාවංසො, පොල්වත්තේ බුද්ධදත්ත හිමි, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ, 1959, 33 පරි. 51 ගාථාව, 84 පිටුව.
22. අදිකාරම්, ඊ. ඩබ්., පැරණි ලක්දිව බෞද්ධ ඉතිහාසය, දෙවන මුද්‍රණය, එස් ගොඩගේ සහ සහෝදරයෝ, මරදාන, 2003, 48 පිටුව.
23. දීපංවසය, 1 පරි. 4-5 ගාථා 1 පිටුව.
24. තදා ච ආහාරාපෙත්වා පහට්ඨො පුඤ්ඤපොත්ථකං
 වාචෙතුං ලේඛකං ආහ සොතං වාචෙසි පොත්ථකං
 ඌනපූරණ සහිතො මහාවංසො, පොල්වත්තේ බුද්ධදත්ත හිමි, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ, 1959, 32 පරි. 25 ගාථාව, 80 පිටුව.
25. සමන්තපාසාදිකා නාම විනයට්ඨකථා, හේ. වි. මු., 1972, 559 පිටුව.
26. 'රදොලන් වැදැ තලන් මීවන් නොකපනු ඉසා' මෙහි තලන් යනු තල්ගස් ද, මීවන් යනු මී ගස් ද වේ. EZ Vol. 1, pp 87.
27. බුද්ධඝෝසුප්පත්ති, 25 පිටුව.
28. -එම-, 50 පිටුව.